කෑගල්ල නගර සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 26 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 අගෝස්තු 25 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට කෑගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>.

1.3.1 <u>ගිණුම්කරණ ප්‍රතිපත්ති</u>

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සමග සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) ශේෂ පත්‍ර දිනට රු. 445,141,678 ක්ව පැවති ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම තුල රු. 30,000,000 ක පිරිවැයකින් යුත් සති පොල කඩ කාමර 150 ක් 2014 ජනවාරි මාසයේදී ගලවා ඉවත් කිරීම හේතුවෙන් වත්කම් සඳහා වූ බලපෑම මූල්‍ය ප්‍රකාශන මගින් අනාවරණය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතු කළ අගය මත බදු, මුද්දර බදු හා ජාතිය ගොඩනැගීමේ බදු එකතුව රු. 601,329 ක් වුවද, එය රු. 3,836,538 ක් ලෙස රු. 3,235,209 ක් වැඩියෙන් දැක්වීම නිසා ශේෂ පත්‍රයේ වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) දේපල බදු දීමේ ලේඛණය අනුව දේපල අයිතම 6 ක් හා ඉඩම්, ගොඩනැගිලි අයිතම 83 ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ශේෂ පත්‍රයේ ස්ථාවර වත්කම් නිවැරදිව දක්වා නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ආසියානු පදනම මඟින් පරිත්‍යාග කර තිබූ පුස්තකාල පොත් 507 ක වටිනාකම ගණනය කර ගිණුම් ගත නොකිරීම හේතුවෙන් ස්ථාවර වත්කම් වල තථ්‍ය වටිනාකම් ශේෂ පත්‍රය මඟින් අනාවරණය කර නොතිබුණි.

(ඉ) ස්ථාවර වත්කම් ලේඛණයේ දක්වා තිබූ රු. 964,975 ක් වූ මෝටර් රථ අයිතම 07 ක් ගිණුම්ගත නොකිරීම නිසා ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) හිඟ මුද්දර ගාස්තු රු. 2,486,842 ක් හා රු. 519,375 ක් වූ හිඟ උසාවි දඩ මුදල් ගිණුම් වලට ගෙන නොමැත.

(උ) සභාව වෙත අයිතිය පවරා නොදුන් සබරගමුව පළාත් ප්‍රධාන ලේකම් යටතේ ඇති වාහන 06 ක් හා මධ්‍යම පරිසර අධිකාරියට අයත් වාහනයක් ඇතුළුව වාහන 07 ක වටිනාකම රු. 7,325,000 ක් ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබීම නිසා ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) රු. 55,653 ක් වූ අභරු චෙක්පතක වටිනාකම අනුචිතව පෙර ගෙවුම් යටතේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 03 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 41,363,129 ක් වූ අතර, උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 30,709,204 ක් වූයෙන් වෙනස රු. 10,653,925 ක් විය.

1.3.4 ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්

2013 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂයන්හි එකතුව පිළිවෙලින් රු. 244,905 ක් හා රු. 43,472,473 ක් විය.

1.3.5 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන අයවැය චක්‍රලේඛය හා ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේදයේ විධිවිධාන පරිදි ස්ථාන මාරුවී ගිය හා සේවය අතහැර ගිය සේවකයන් 16 දෙනෙකුගෙන් රු. 182,324 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.3.6 බලය නොලත් ගණුදෙනු

2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වත්කම්වල උපලේඛණ හා භාණ්ඩ සමීක්ෂණ ශේෂයන් සමාන කිරීම සඳහා ජ'නල් සටහන් 05 ක් මඟින් රු. 5,111,597 ක් විධිමත් අනුමැතියකින් තොරව ගිණුම් අතර ගලපා තිබුණද, සමාලෝචිත වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී එය නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

02. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 49,050,076 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 23,342,929 ක් වූයෙන් රු.25,707,147 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් වැඩිවීම හා ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා කිරීමේ හා නඩත්තු කිරීමේ වියදම් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර්31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බද | 9,985 | 10,533 | 548 |
| (ii) බදු කුලී | 33,876 | 34,246 | 370 |
| (iii) බලපත්‍ර ගාස්තු | 860 | 1,330 | 470 |
| (iv) වෙනත් ආදායම් | 66,546 | 81,044 | 14,498 |

2.3.2 මුද්දර ගාස්තු

2013 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතුව තිබූ රු. 2,486,842 ක් වූ මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.3 සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

සම්ප්‍රේෂණ කුළුණු 06 ක් ඉදි කිරීම සඳහා සංවර්ධන අවසර පත්‍ර ලබා දීමට කටයුතු කර නොතිබුණි. බලපත්‍ර ගාස්තු රු. 130,000 ක් අය කර නොතිබූ අතර සම්ප්‍රේෂණ කුළුණු 11 කට අදාලව අනුකූලතා ගාස්තු රු. 36,000 ක් 1597/8 හා 2009 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් නිවේදනයේ විධිවිධාන අනුව අයකර ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

2.3.4 ආදායම් අය කරගැනීම

සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට තිබූ රු. 26,813,155 ක් වූ හිඟ ආදායම් වලින් රු. 4,447,013 ක් පමණක් අයකර ගෙන තිබුණි. එය හිඟ ආදායමින් 17% ක තරම් අඩු ප්‍රතිශතයක් බැවින් හිඟ ආදායම් අය කර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 නිශ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති භෞතික සම්පත් පිළිබඳ නියැදි විගණන පරීක්ෂණ වලදී එකතුව රු. 897,500 ක් වූ වත්කම් පැවති බව අනාවරණය විය.

3.2 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

මිරිහැල්ල අතුපාරෙන් හැරෙන උතුරු රවුම්පාර දක්වා දිවෙන මාර්ගය කුට්ටි ගල් අතුරා සැකසීම වෙනුවෙන් මිණුම් වාර්තාවේ වැඩ විෂය අංක 06 යටතේ සැටරින් යෙදීම සම්බන්ධයෙන් 2014 පෙබරවාරි 27 දින කරනු ලැබූ භෞතික විගණන පරීක්ෂාවේදී කර්මාන්තයේ සැටරින් නොගැසූ වර්ග මීටර් 15.03 ක් වෙනුවෙන් රු. 12,626 ක මුදලක් වැඩියෙන් ගෙවීම් කර තිබූ බව නිරීක්ෂණය විය.

04. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ණයගැති පාලනය

(ii) තොග පාලනය

(iii) වත්කම් කළමනාකරණය